ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 1.2.1, 1.2.2, 1.2.3 ,1.2.4 සහ 1.2.5 ඡේදවල දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

2012 වර්ෂයේ සිට හඳුන්වා දී තිබූ, ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර ආකෘතිමය රාමුව පරිදි ගිණුම් ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) භාණ්ඩාගාරය විසින් කල්බදු පදනම මත මණ්ඩලයට ලබා දී තිබූ රු. මි. 12.2 කැබ් රථ දෙකෙහි වටිනාකම සහ රු.මිලියන 2.4 ක් වූ එහි ක්ෂයවීම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය වාර්තාවල දක්වා නොතිබුණි. එසේ වුවද කැබ්රථ දෙක වෙනුවෙන් වැයකර තිබූ අර්ධ සුබෝපභොගී බදු මුදල සහ ලියාපදිංචි ගාස්තුව වූ රු. 87,755 ක් ස්ථාවර වතකම් ලෙස ගිණුම්ගත කර ඒ සඳහා රු. 17,551 ක ක්ෂය කිරීමක් ද සිදු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් උපලේඛනයෙහි දක්වා තිබූ රු. 546,352 කවූ විවිධ වත්කම්වල ලියා අඩු කළ අගය මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ ගොඩනැගිලිවලට එකතු කර තිබූ රු.12,639,162 ක වටිනාකම් පිළිබඳ විස්තර ස්ථාවර වත්කම් උපලේඛනයෙහි දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිවිනැගුම ව්‍යාපෘතියෙහි බැංකු ශේෂය රු.3,666,095 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි බැංකු ශේෂය නමින් වර්ගීකරණය නොකොට කෙර්ගෙනයන වැඩ වශයෙන් දක්වා තිබුණි. තවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙද එම බැංකු ගිණුමේ ශේෂය දක්වා නොතිබුණි.

(ඉ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වත්කම් යටතේ ලැබිය යුතු එකතු කළ අගය මත බදු වශයෙන් රු.12,895,522 ක් දක්වා තිබුණද, 2012 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණු බදු වාර්තාවේ එය රු.567,848 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව රු.12,327,674 ක ඉදිරියේදී අයකර ගැනීමට නොහැකි එකතු කළ අගය මත බදු මුදලක් ජංගම වත්කම්වල පෙන්වා තිබුණි.

(ඊ) දැනට භාවිතයේ නොපවතින ලැබිය යතු භාණ්ඩ හා සේවා බදු (GST) රු.1,424,654 ක් ජංගම වත්කමක් යටතේ දක්වා තිබුණි.

(උ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාස 03 ට වැඩි රු.25,000 ක්වූ ස්ථාවර තැන්පතු ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආරම්භක හා අවසාන මුදල් ශේෂයට ගෙන තිබුණි.

(ii) පොලී වියදම වූ රු.19,644 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ නිවැරදිව දක්වා නොතිබුණි.

(iii) පැහැදිලි නොකරන ලද රු.5,311,000 ක මුදලක් පෙර වර්ෂ ගැළපුම් වශයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ බදු වලට පෙර අලාභ යටතේ ගලපා තිබුණි.

(iv) මූල්‍ය ප්‍රකාශන අනුව රජයේ ශුද්ධ දායකය රු.14,887,216 ක් වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.18,000,000 ක් ලෙස දක්වා තිබුණි.

(v) ආයෝජන නොවන රු.3,113,000 ක මුදලක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ඌ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණු අගයන් ස්ථාවර වත්කම් උපලේඛනය සමඟ සැසඳීමේදී එකතුව රු. 506,573 ක වූ වත්කම් විෂයයන් හතරක් අඩුවෙන්ද, එකතුව රු. 3,186,235 ක්වූ වත්කම් විෂයන් හයක් වැඩියෙන්ද දක්වා තිබුණි.

1.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට බින් පත්‍රවල සඳහන් රු.5,060,052 ක්වූ අබලි ද්‍රව්‍ය තොගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණත්, එම තොගය භෞතිකව පරීක්ෂා කර නොතිබුණි.

(ආ) උපයනවිට ගෙවීමේ බද්ද (PAYE) හා ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) වශයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද බදු වාර්තාවේ (Tax Return) දක්වා තිබුණු වටිනාකම රු.842,733 කින් ඉක්මවා රු. 1,286,073 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ජංගම බැරකම් වල දක්වා තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත ඉදිරිපත් කර තිබුණු වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම අරමුදල් වලට ගෙවිය යුතු ශේෂ වලින් පිළිවෙලින් රු. 244,841 ක් හා රු.34,818 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව සඳහන් කර තිබුණු අබලි ගැනුම් හා විකුණුම්, අලෙවි අංශය පවත්වාගෙන යනු ලබන වාර්තා සමග සසඳා නොතිබුණි. ඒ අනුව, රු.8,056748 ක් වූ අබලි ගැනුම් වැඩියෙන්ද රු. 141,822 ක්වූ අබලි විකුණුම් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වත්කම් යටතේ ලැබිය යුතු එකතු කළ අගය මත බදු ලෙස රු.12,895,522 ක් දක්වා තිබුණත්, දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබන බදු වාර්තාවේ එය රු.567,848 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, රු.12,327,674 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ණයගැති කාල විශ්ලේෂණය අනුව අවුරුදු 05 ඉක්මවන ලද ණයගැති වටිනාකම රු.32,585,627 ක් වූ අතර එම මුදල් ශේෂ නිරවුල් කර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.58,419,824 ක ණයගැති ශේෂ සනාථ කර නොතිබුණි. ශේෂ සනාථ විගණනයට යොමු කිරීමට කටයුතු කරන ලෙස කළමනාකරණයට දන්වා සිටියද ඒ පිළිබඳ කටයුතු කර නොතිබුණි.

(iii) මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු වර්ෂ 03 කට අධික කාලයක සිට පැවත එන එකතුව රු.20,725,888 ක් වූ අයවිය යුතු ශේෂයන් 23 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **ගෙවියයුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 දෙසැම්බර් 31 දිනට ණයහිමි කාල විශ්ලේෂණය අනුව ගිණුම් 44 කට අදාළව රු.112,869,335 ක ණයහිමි ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ජනපද වලින් ඉවත් වූ බවට නිරීක්ෂණය වූ කර්මාන්තකරුවන් 239 කට අදාළව රු.5,873,965 ක ආපසු ගෙවිය යුතු තැන්පත් ගිණුම්වල සදොස් අගයන් දක්වා තිබුණි.

(iii) රජයේ ඉඩම් සින්නක්කර පැවරීම තහනම් කර තිබුණද කාර්මික ජනපදවල පවතින රජයේ ඉඩම් සින්නක්කර පැවරීම සඳහා කර්මාන්තකරුවන් 126 ක ගෙන් ලබාගෙන තිබූ රු.14,843,613 ක තැන්පත් මුදල් වර්ෂ ගණනාවක සිට නිරවුල් කර නොතිබුණි.

(iv) වසර 03 ට වැඩි කාලයක සිට පැවත එන රු.81,096,571 ක් වූ ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

විස්තර	වටිනාකම	ඉදිරිපත් නොකළ සාක්ෂි
	රු.	
ඉඩම්	58,470,313	විස්තරාත්මක උපලේඛන
කෙරීගෙන යන වැඩ	14,298,021	සත්‍යාපන වාර්තා
අබලි තොග	5,060,052	සත්‍යාපන වාර්තා
නිමි තොග	2,480,536	සත්‍යාපන වාර්තා
පැලියගොඩ රබර් භාණ්ඩ සංවර්ධන මධ්‍යස්ථානයට මිලදීගත් අමුද්‍රව්‍ය	21,679,394	තොග ලෙජර්
බැංකු ශේෂ	19,529,989	ශේෂ සනාථ කිරීම්

1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xiv පරිච්ඡේදයේ 4.1 උපපේදය	ක්ෂේත්‍ර රාජකාර්වල යෙදීමේදී නිලධාරීන්ට තම වියදම් පියවා ගැනීමට සංයුක්ත දීමනා හා ගමන් වියදම් දීමනා ගෙවිය හැකි වුවත්, ඊට අමතරව දිවි නැගුම ව්‍යාපෘතියේ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් ලැගුම් දීමනා ගෙවා තිබුණි. 2012 ජනවාරි සිට මාර්තු දක්වා ඒ වෙනුවෙන් රු. 40,856 ක මුදලක් වැය කර තිබුණි.
(ආ) රජයේ මුදල් රෙගුලාස	
(i) මු.රෙ. 104 හා 109	මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. 132,107 ක් ව වසර ගණනාවක සිට පැවත එන මුදල් ශේෂ භෞතිකව නොතිබුණත්, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii) මු.රෙ. 110	හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි.
(iii) මු.රෙ.453	පුද්ගල පඩි නඩි ලේඛනයක් පවත්වා නොතිබුණි.
(iv) මු. රෙ. 751(1) සහ මණ්ඩලයේ ගබඩා ක්‍රියාපටිපාටි සංග්‍රහයේ 52(1)වගන්තිය	ගබඩා භාරකරුවන් විසින් ගබඩා ලෙජරයක් පවත්වා නොතිබුණි.
(v) මු.රෙ.772	වර්ෂ ගණනාවක සිට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් පෙන්වා දී තිබුණු සුදුස්සක් කොට බැහැර කළයුතු භාණ්ඩ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(vi) මු.රෙ. 802- (1), (2) හා (3)	වාහන අලුත්වැඩියා හා නඩත්තු වියදම් වශයෙන් වැයකළ රු.3,178,180 ක් පරීක්ෂා කිරීම සඳහා අදාළ ලේඛන හා ලිපිගොනු 37 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(vii)	මු.රෙ. 1645(අ)	වාහන 08 ක් සම්බන්ධයෙන් වාහන ලොග් සටහන් පොත් විධිමත් පරිදි පවත්වා නොතිබුණි.
(viii)	මු.රෙ. 1645(ආ)සහ(ඇ) මු.රෙ.1646	වාහනවල දෛනික ධාවන සටහන් සහ ගමන් පිළිබඳව මාසික සංසිද්ධි වාර්තා ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) චක්‍රලේඛ

(i)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. මිලියන 242.6 ක ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ii)	2002 නොවැම්බර් 28 දිනැත අංක.අයිඒඅයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. මිලියන 8.9 ක පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි.

ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය

6.3.6 මාර්ගෝපදේශය	පැලියගොඩ රබර් ආයතනයට රු.4,178,711 ක් වටිනා අමුද්‍රව්‍ය මිලදී ගැනීමට අදාළ ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘතියේ සටහන් කර ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් සියලු දෙනා එහි අත්සන් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය රු.මිලියන 227.4 ක් වූ අතර වර්ෂය තුළ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රජයේ දායකය ගණන් ගැනීමට පෙර රු. මිලියන 257.5 ක ඌනතාවයක් විය. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රජයේ දායකය වූ රු.මිලියන 228 ගණනය කිරීමට පෙර ඌනතාවය රු.මිලියන 234.8ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 22.7 ක පිරිහීමක් නිරීක්ෂණය විය. අභ්‍යන්තර ආදායම් රු.මිලියන 2 කින් අඩුවීම, අමු ද්‍රව්‍ය පාරිභෝජන ද්‍රව්‍ය රු.මිලියන 10.8 කින් වැඩිවීම, කාර්ය මණ්ඩල වියදම් රු.මිලියන 9 කින් වැඩිවීම හා ගිවිසුම්ගත සේවා වියදම රු.මිලියන 3.6 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි මූලිකව බලපා තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

එක් එක් වර්ෂවල රජයේ ප්‍රදානයන් සැලකිල්ලට ගැනීමෙන් පසු 2010 වර්ෂයේ රු.මිලියන 18.6 ක් ද 2011 වර්ෂයේ රු.මිලියන 6.7 ක් ද, 2012 වර්ෂයේ රු.මිලියන 30.1 ක්ද වශයෙන් මණ්ඩලය දිගින් දිගටම ශුද්ධ අලාභයන් ලබමින් පැවැති අතර සමාලෝචිත වර්ෂයේ අවසානයට සමුච්චිත ශුද්ධ අලාභය රු.මිලියන 367.2 වී තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

(අ) ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පොදු සේවා මධ්‍යස්ථාන

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගම්මාන සංවර්ධන වැඩසටහන් යටතේ පොදු සේවා මධ්‍යස්ථාන සහිත නිෂ්පාදන ගම්මාන 106 ඉදිකර තිබුණද එයින් මධ්‍යස්ථාන 15 ක් ජනතා අයිතියට පවරා නොතිබුණි.

(ii) ජනතා අයිතියට පවරා තිබුණු පොදු සේවා මධ්‍යස්ථාන 91 කින් 25 ක් අක්‍රිය වී තිබුණි.

(iii) පොදු සේවා මධ්‍යස්ථාන රහිත නිෂ්පාදන ගම්මාන 156 කින් මධ්‍යස්ථාන 94 ක් අක්‍රීය වී තිබුණි.

(ආ) දිවිනැගුම ව්‍යාපෘතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට දිස්ත්‍රික්ක මට්ටමින් වෘත්තීය පුහුණුව අවසන් කර තිබුණු ප්‍රතිලාභීන් 2100 කින් 574 කට පමණක් වෘත්තිය කරගෙන යාමට අවශ්‍ය උපකරණ නිකුත් කර තිබුණි. ඒ අනුව පුහුණුව ලද ප්‍රතිලාභීන් වැඩි පිරිසකට වෘත්තිය කරගෙන යාමට අවශ්‍ය උපකරණ නොතිබීමෙන් එහි සාර්ථකත්වය අඩුවී තිබුණි.

(ii). දිවිනැගුම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් සඳහා මෙවලම් හා උපකරණ මිලදී ගැනීමට 2011 වර්ෂයේදී ත්‍රිකුණාමලය දිස්තික් ලේකම් වෙත රු. 12,350,000 ක ලබාදී තිබූ අතර, එම මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු. 5,922,190 ක හෙවත් සියයට 48 ක ප්‍රතිශතයක් පමණක් වැයකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා සලසා තිබූ රු.මිලියන 8.2 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4.2 ක් හෙවත් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 51 ක් පමණක් වැය කර තිබුණි.

(ඈ) මණ්ඩලයේ ගබඩා ක්‍රියාපටිපාටි සංග්‍රහයේ 50.1.1 ඡේදය අනුව ගබඩා භාරකරු භාරයේ ඇති සියලු භාණ්ඩ සම්බන්ධයෙන් බින් කාඩ් පත් පවත්වාගෙන යායුතු වුවත්, කිතුල් ව්‍යාපෘතියේ හා ගම්මාන ව්‍යාපෘතියේ තොග සම්බන්ධයෙන් බින් කාඩ් පත් පවත්වා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එම තොග ශේෂයන්වල වටිනාකම රු.13,408,599 ක් වී තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ සේවක සුභසාධන වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සඳහා 2007 වර්ෂයේ සිට 2012 ජුලි 31 දින දක්වා රු.7,136,207 ක මුදලක් මණ්ඩලයේ අරමුදල් වලින් වැය කර තිබුණි.

වෛද්‍යාධාර යෝජනා ක්‍රම ව්‍යවස්ථාවේ 20 වන රෙගුලාසිය පරිද ගිණුම් සහ පාලන වාර්තා සකස් කර මණ්ඩලයේ පාලක සභාව වෙත ඉදිරිපත් කළයුතු වුවත්, වර්ෂ ගණනාවක සිට එසේ සිදු කර නොතිබුණු අතර ඒ සඳහා විගණකවරයෙක ද පත්කර නොතිබුණි. මණ්ඩලය රු.4,063,571 ක වෛද්‍යාධාර අරමුදලින් ලබාගෙන තිබුණු අතර, එම මුදල ද 2012 දෙසැම්බර් 31 දින වන විටත් වෛද්‍යාධාර අරමුදලට පියවා නොතිබුණි.

(ආ) මහල් තුනකින් සමන්විත ගොඩනැගිල්ලේ බිම් මහල හා දෙවන මහල පමණක් ලක්කම් අලෙවි මධ්‍යස්ථානය භාවිතා කරන අතර තෙවන මහල ශ්‍රවණාගාරය සඳහා භාවිතා කරයි. මහල් තුන සඳහා එකම විදුලි මීටරයක් සවි කර තිබීම නිසා මෙම මධ්‍යස්ථානය උපයන ආදායමෙන් අධික විදුලි වියදමක් දැරීමට සිදුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේද රු.1,757,740 ක විදුලිය සඳහා වැයකර තිබුණි. මෙම මධ්‍යස්ථානය වර්ෂ ගණනාවක සිට පාඩු පිට පවත්වාගෙන යනු ලබයි.

(ඇ) කාර්යාල සහ වැසිකිලි පහසුකම් ලබාගැනීම සඳහා ඉහත ගොඩනැගිල්ලේ සිදුකරන ලද අතිරේක ඉදිකිරීම් සඳහා 2009 වර්ෂයේ රු.7,000,000 ක්ද, 2011 වර්ෂයේදී රු.3,000,000 ක් ද ප්‍රතිපාදන වශයෙන් භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණි. 2009 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන උපයෝජනය 2011 මාර්තු මාසය දක්වා ප්‍රමාද කර තිබුණු අතර 2011 වර්ෂයේදී මෙම ගොඩනැගිල්ලට මුළු පිරිවැය රු. 10,000,000 ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කර නොතිබුණු අතර, අතිරේක ඉදිකිරීමෙන් මහල් 02 ක් 2012 අප්‍රේල් වන විටත් ඉදිකර තිබුණත් එහි වහලය ඇතුළු අනෙකුත් ඉතිරි වැඩ ඉටු නොකිරීම නිසා වර්ෂයකට වැඩි කාලයක සිට ස්වාභාවික උපද්‍රවයන්ට ලක් වෙමින් පැවැතුණි.

(ඈ) මණ්ඩලය ආසන්නයේ පිහිටි රජයේ ඉඩමක කර්මාන්තකරුවන් සඳහා පෙර වැඩුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට 2005 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණත්, 2012 වර්ෂය අවසානය තෙක් එම ඉඩම් පවරා ගැනීම සිදුකර නොතිබුණි. යෝජිත භූමිය තුළ අනවසර පදිංචිකරුවන්ගේ පදිංචිය හේතුකොට ගෙන පෙරවැඩුම් මධ්‍යස්ථානය ක්‍රියාත්මක නොවන අතර එම භූමියේ ඇති මණ්ඩලයේ අබලි ව්‍යාපෘතියටද ගබඩා පහසුකම් සපයා ගෙන නොතිබුණි.

(ඉ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හේතුවෙන් පැන නැගී තිබුණ වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා සුදුසු නිර්දේශ ලබා ගැනීම පිණිස ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩය විසින් අනුමත කර පත් කරන ලද උපදේශකවරයා විසින් ඉදිරිපත් කළ වාර්තාවේ නිර්දේශ 2012 දෙසැම්බර් 31 වන විටත්, ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) කර්මාන්තකරුවන්ට අමද්‍රව්‍ය ලබා ගැනීම යනාදී පහසුකම් සැලසමේ අරමුණින් චක්‍රීය අරමුදලක් පිහිටුවීම සඳහා සෙස් අරමුදලින් රු.මිලියන 10 ක මණ්ඩලයට ලබාදී තිබුණත්, 2009 වර්ෂයේ සිට අපේක්ෂිත අරමුණ ඉට කරගෙන නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 10.7 ක් වූ එම මදල ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි.

(උ) අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව අබලි මිලදී ගැනීම, විකිණීම සහ ගබඩා කිරීමට අදාළව රෙගුලාසි පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම තත්ත්වය හේතු කොටගෙන ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලදී විවිධ අක්‍රමිකතා සිදු වී තිබුණු බව පහත පරිදි නිරීක්ෂණය වී තිබුණි.

(i) 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා පවතින රෙගුලාසිවලට පටහැනිව පෙර ගෙවුම් ලෙස රු.මිලියන 108.5 ක විවිධ රාජ්‍ය ආයතනයන්ට, නිකුත් කර තිබුණි. එම අත්තිකාරම් මුදල් වලින් රු.මි. 52.3 ක් අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා නිකුත් කර තිබුණි.

(ii) මණ්ඩලය මිලදී ගන්නා අබලි ද්‍රව්‍ය වෙනුවෙන් විවිධ රාජ්‍ය ආයතනයන්ට 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.2,170,727 ක මුදලක් ගෙවීමට තිබෙන බවට ව්‍යාපෘතිය අලෙවි අංශයේ වාර්තාවල දක්වා තිබුණත් මුදල් අංශයේ ගිණුම්වල එම තොරතුරු දක්වා නොතිබුණි. එසේම එම මුදල් නිරවුල් කර නොතිබුණි.

(iii) 2012 දෙසැම්බර් 31 දිනට අබලි අංශයේ බැංකු ගිණුමේ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2011 හා 2012 වර්ෂවල පිළිවෙලින් රු. 296,962 ක් හා රු. 516,279 ක් ද වශයෙන් එකතුව රු. 813,241 ක හඳුනා නොගත් තැන්පතු ගිණුම්ගත කර නොතිබුණි.

3.3 මතභේදයට තුඩුදුන් ගනදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලක්කම් අලෙවි මධ්‍යස්ථානය කර්මාන්තකරුවන්ගේ භාණ්ඩ විකුණා පසුව මුදල් ගෙවන පදනම මත භාණ්ඩ අලෙවි කරනු ලබන අතර තොග ලැබීම් හා නිකුත් කිරීම සඳහා නිසි පරිදි තොග පොත්පත් පවත්වා නොතිබුණි. ඒ වෙනුවට එක් එක් සැපයුම්කරු වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ලිපිගොනු වල අවිධිමත් ලෙස තොග ලැබීම් හා නකුත් කිරීම් සටහන් කර තිබුණි.

(ආ) ප්‍රාදේශීය කාර්යාලයන් සඳහා ක්‍රියාත්මකව පැවතුන බැංකු ජංගම ගිණුම් වසා දමා තිබුණත්, එම බැංකු ගිණුම් 08 ක රු.135,233 ක වාසිදායක ශේෂයක් හා බැංකු ගිණුම් 01 ක රු.175 ක අයිරා ශේෂයක්ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඇ) මණ්ඩලයේ බැංකු ගිණුම්වල සමාලෝචිත වර්ෂය තුළ අයිරා ශේෂ පැවතීම නිසා ඒ සඳහා පොලී වශයෙන් රු.19,663 ක ගෙවා තිබුණි.

(ඈ) මණ්ඩලය තුළ ක්‍රියාත්මක වන අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය මගින් විවිධ රාජ්‍ය ආයතනයන්ට අබලි මිලදී ගැනීමට පෙර සිදුකර තිබූ රු.37,992,038 ක පෙර ගෙවුම් සඳහා මුදල් හෝ අබලි ද්‍රව්‍ය නොලබා නැවතත් එවැනි ආයතන 08 ක් සඳහා රු.28,391,374 ක පෙර ගෙවුම් කර තිබුණි.

3.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

මුද්‍රණ අංශය සතුව අක්‍රිය මුද්‍රණ යන්ත්‍ර 03 ක් පවතින අතර, ඉන් එක් යන්ත්‍රයක (wire stiching Machine) වටිනාකම රු.211,495 ක් විය. ඉතිරි යන්ත්‍ර (offset Machine & Cutter) දෙකෙහි වටිනාකම අනාවරණය නොවූ අතර, එම යන්ත්‍ර වසර ගණනාවක සිට භාවිතයට ගෙන නොතිබුණි. එම යන්ත්‍ර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ සුදුස්සක් කිරීමට 2012 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරුණු ලැබේ.

(අ) විවිධ වැඩසටහන් සඳහා සම්පත්දායකයින් තෝරාගත් පදනම හා ඔවුන් සඳහා පැයකට රු.1000, රු.2000 හා දිනකට රු.6,000 වශයෙන් විවිධ රේට් ප්‍රමාණයන් මත කර තිබුණු ගෙවීම් සඳහා ලබාගත් අනුමැතියන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) දිවි නැඟුම ව්‍යාපෘතිය සඳහා ලද මුදල් වලින් රු.6,000,000 ක් අවස්ථා 3 කදී මණ්ඩලයේ වෙනත් ගිණුම් වලට මාරු කර තිබූ අතර, එයින් රු.1,400,000 ක් තවදුරටත් ව්‍යාපෘති ගිණුමට ලැබිය යුතුව තිබුණි.

(ඇ) සේවක නඩුවක් වෙනුවෙන් හිඟ වැටුප් හා නීතිඥ ගාස්තු වශයෙන් රු.562,800 ක දිවි නැඟුම ව්‍යාපෘතියට අදාළ නොවන වියදමක් එම ව්‍යාපෘතියෙන් ගෙවා තිබුණි.

(ඈ) අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ අරමුදල එම ව්‍යාපෘති කාර්යයන් සඳහා යෙදවිය යුත වුවද ඊට බැහැරව එම අරමුදලින් රු.3,171,000 වැය දරා මණ්ඩලයේ නිලධාරීන් සඳහා යතුරු පැදි 25 ක් මිලදී ගෙන තිබූණි.

3.6 හඳුනාගන්නා ලද පාඩු

අබලි අංශයෙන් මිලදී ගෙන තිබූ විදුලි ට්‍රාන්ස්පොමර් 15 ක පිටත ආවරණය හැර ඇතුළත තිබිය යුතු තඹ කම්බි ලැමිනේෂන් හා ට්‍රාන්ස්පෝමර් ඔයිල් ඉවත් කරගෙන තිබුණි. තොග වාර්තාව අනුව එහි ගැනුම් මිල රු.1,270,964 ක් වී තිබුණ. මෙම තොගය භෞතික සත්‍යාපනය කර නොතිබුණු අතර, සිදුවී තිබුණු තොග හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

කාර්මික සංවර්ධන මණ්ඩලයට බඳවාගෙන තිබූ සංඛ්‍යා ලේඛන විමර්ශකවරයෙකු හා රියදුරන් දෙදෙනෙකු වෙනත් රජයේ ආයතන සඳහා නිදහස් කර තිබුණි. 2012 මැයි මාසය දක්වා ඔවුන්ගේ වැටුප්, අතිකාල දීමනා වෙනුවෙන් රු.5,283,026 ක මණ්ඩලය විසින් වැයකර තිබුණත්, එම මුදල් 2012 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

3.8 මානව සම්පත් කළමනාකරණය

මණ්ඩලයේ අනුමත, තථ්‍ය සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු පහත පරිදි විය.

ශ්‍රේණිය	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ඉහළ සහ මධ්‍යම කළමනාකරණය	80	69	11
පහළ කළමනාකරණය	182	107	75
කළමනාකරණ සේවය	186	128	58
ශිල්පීය	149	76	73
ශිල්පීය නොවන	117	99	18
එකතුව	714	479	235

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව 2013 ජූනි 30 දින වන විටත් බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරගෙන නොතිබුණි.

(ආ) පුරප්පාඩු තනතුරු 235 ක් 2012 දෙසැම්බර් 31 වන විටත් පුරවා නොතිබුණි.

(ඇ) 2006 මැයි සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා මණ්ඩලය විසින් 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව අනුමැතියකින් තොරව අනියම් පදනමින් 48 ක් බඳවාගෙන තිබුණ අතර ඔවුන්ගේ සේවා කාල පරාසය වසර 1 සිට 5 දක්වා විය.

3.9 සේවක පාර්තෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

සමාලෝචිත වර්ෂය අවසානයට රු.100,990,758 ක් වූ සේවක පාර්තෝෂික ප්‍රතිපාදනය මණ්ඩලයෙන් පිටත ආයෝජනය කර නොතිබුණි. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අදහස වනුයේ "ආයෝජනය කිරීමට අවශ්‍ය අරමුදල් මණ්ඩලය තුළ නොමැතිවීම" බවයි.

3.10 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගමින් ගමට තාක්ෂණය බෙදාහැරීමේ අරමුණින් 2009 වර්ෂයේ රු.7,950,000 ක වැයකර මිලදී ගත් බස් රථය දැනට වසර තුනක පමණ කාලයක සිට අපේක්ෂිත අරමුණු වෙනුවෙන් යොදවා නොතිබුණි. සමාලෝචිත වර්ෂයට ඉලක්කගත සැලසුමකින් තොරව ප්‍රදර්ශන රාජකාරී 06 ක් සඳහා බස්රථය යොදා ගෙන තිබුණු අතර ඒ සඳහා කිලෝමීටර් 2500 කට වඩා අඩුවෙන් ධාවනය කර තිබුණි.

(ආ) මණ්ඩලය සතු වාහන 42 කින වාහන 09 ක මයිලෝමීටරය අක්‍රියව පැවතුණි. එම වාහන වෙනුවෙන් රු.1,127,622 ක් වූ ඉන්ධන පරිභෝජනය කර තිබුණත්, එහි නිවැරදිතාවය සනාථ කර ගැනීමට වාහනය ධාවනය කළ දුර ප්‍රමාණය පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.

4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම

2011-2013 කාලපරිච්ඡේදය සඳහා මණ්ඩලය විසින් 2011 වර්ෂයේදී රු.මිලියන 2.2 වැයකර සංයුක්ත සැලැස්මක් සකස්කර තිබුණත්, එහි දක්වා තිබෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීමට ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගතිය

2012 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට අනුමත කරගෙන තිබුණද, කාර්යසාධන ප්‍රගතිය ඇගයීම සඳහා වාර්ෂික ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර තිබුණත් අභ්‍යන්තර විගණන සැලසුමට අනුව ප්‍රමාණවත් විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

4.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනය අනුව වියදම් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයන් තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී විචලතාවන් නිරීක්ෂණය විය. අයවැයගත ප්‍රතිපාදන හා තථ්‍ය වියදම් අතර වෙනස සියයට 10 ත් සියයට 50 අතර ප්‍රතිශතයන් ගත් අවස්ථා ගණන 24 ක් වී තිබුණි.

(ආ) වර්ෂයේ අයවැයගත ආදායම රු. 350,720,000 ක් වුවත් තථ්‍ය ආදායම රු.162,510,332 ක් වූයෙන් රැස්කළ ආදායම ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 53 ක් වී තිබුණි.

(ඇ) මණ්ඩලයේ තාක්ෂණ සේවා, ඉංජිනේරු, අබලි, ලක්කම්, ලක් නිපැයුම් යන අංශවල ආදායම් ඉලක්කයන් කරා ළඟා වීම සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණ.

(ඈ) අයවැයගත වියදම් විධිමත් පරිදි පාලනය කිරීම සඳහා වැය ලෙජර් භාවිතා කර නොතිබුණි.

4.5 නොවිසඳී ඇති විගණන ජේද

(අ) මෙම වාර්තාවේ දිනය තෙක් ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොතිබුණු පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දුන් නියෝග.

	විෂයය	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝගය	පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේ දිනය	වර්තමාන තත්වය හෝ නිරීක්ෂණ
(i)	මුදල් කළමනාකරු තනතුරේ පුරප්පාඩුව	සියලුම තනතුරු සම්බන්ධයෙන් බඳවාගැනීමේ ක්‍රමය පිළිබඳ අධීක්ෂණය කර සියලු පුරප්පාඩු පිරවීම	2010 දෙසැම්බර් 09	මුදල් කළමනාකාර තනතුර ඇතුළු අත්‍යවශ්‍ය තනතුරු පුරවා නොතිබුණි.
(ii)	රු.මි.7.7 කට මිලදී ගෙන තිබුණු ජෙනරේටරය	ජෙනරේටරය පාවිච්චියට ගැනීමෙන් තොරව විකිණීම නිසා රු.මි.3.3 ක අලාභයක් දැරීමට සිදු වී තිබුණු බැවින් අදාළ සියලුම නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණ පවත්වන ලෙස දන්වා ඇත.	2012 නොවැම්බර් 16	පරීක්ෂණ පවත්වා අවසන් කර නොතිබුණි.

(iii)	දෝෂ සහිත අත් සකපෝරු 68 ක් සහ තොග ඌනතා අත් සකපෝරු 79	තොග ඌනතා නිරීක්ෂණය වූ අත් සකපෝරු 79 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලෙස දන්වා ඇත.	2012 නොවැම්බර් 16	පරීක්ෂණ පවත්වා අවසන් කර නොතිබුණි.
(iv)	රු.1,412,100 ක් වූ බදුල්ල නිෂ්පාදන ප්‍රදර්ශනාගාරය	අපේක්ෂිත කාර්යයන් සඳහා විවෘත කිරීමට පියවර ගන්නා ලෙස දන්වා ඇත.	2012 නොවැම්බර් 16	ප්‍රදර්ශනාගාරය ඉදිකිරීම් අවසන්කර දැනට වර්ෂ පහක කාලයක් ගතවී තිබුණද මෙම වාර්තාවේ දිනය තෙක් විවෘත කර නොතිබුණි.
(v)	ශ්‍රී ලංකා රේගුව වෙත අබලි භාණ්ඩ මිලදී ගැනීම සඳහා නිකුත් කර තිබූ රු.මිලියන 4.6 අත්තිකාරම	අබලි භාණ්ඩ හෝ මුදල් ලබා ගැනීමට කටයුතු කළයුතු බව.	2012 නොවැම්බර් 16	ගෙවන ලද මුදල් වලින් රු.175,765 ක මුදලක් මෙම වාර්තාවේ දිනය තෙක් ප්‍රතිපූරණය කර නොතිබුණි.
(vi)	සී.ස කර්මාන්ත සේවා සමාගමේ රු.මිලියන 5.3 ආයෝජනයෙන් වූ අලාභය	විධිමත් අනුමතියක් ලබාගෙන ලියාහැරීමට කටයුතු කළයුතු බව දන්වා ඇත.	2012 නොවැම්බර් 16	මෙම වාර්තාවේ දිනය තෙක් ඉටුකර නොතිබුණි.
(vii)	ක්‍රියාත්මක නොවන කාර්මික ජනපද	දිවයිනේ කාර්මික ජනපද කලාප 18 සම්බන්ධව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත.	2012 නොවැම්බර් 16	එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. තවදුරටත් හිස්වූ කර්මාන්ත 89 ක් සහ අක්‍රීය කර්මාන්ත 100 ක් පවතින අතර අනවසර පදිංචිවීම් ද පැවතුණි.
(viii)	අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය	අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම් සහ විකිණීම සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක්	2012 නොවැම්බර් 16	මිලදී ගත් ස්ථානයේම තවදුරටත් අලෙවි කිරීම් සිදුකර තිබුණි.

(ආ) පසුගිය විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණත්, ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොමැති කරුණු

(i) ගෝනපුර ආහාර ව්‍යාපෘතිය සඳහා 2006 පෙබරවාරි 03 දින එකක් රු.98,500 බැගින් රු. 295,500 ක් වැය කොට මිලදී ගන්නා ලද යන්ත්‍ර (Dough mixer machine) 3 ක් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය ඉක්ම යමින් ගබඩාවේ පැවතුණි.

(ii) මහියංගන මියුනුගම දිඹුලවත්ත නම් වූ පර්චස් 80 ක ඉඩම තුළ පිහිටි වර්ග අඩි 1400 කින් යුත් ජල විදුලිය සහිත ගොඩනැගිල්ල හා ඉඩම වර්ෂ 14 කට අධික කාලයක සිට කිසිදු කාර්යයකට යොදාගෙන නොතිබුණි.

(iii) පන්නල යෝග්‍ය තාක්ෂණ මධ්‍යස්ථානයේ 25 දෙනෙකුට පමණ නවාතැන් පහසුකම් ඇති නේවාසිකාගාරය 2004 වර්ෂයේ සිට වසා දමා තිබුණි.

(iv) බිම්මල් ව්‍යාපෘතියක් සඳහා රු.1,180,000 වැයකර මිලදී ගෙන තිබූ බිම්මල් වියලන යන්ත්‍රයේ කොටසක් අස්ථානගත වී තිබුණු අතර, යන්ත්‍රය නිෂ්ක්‍රීයව මණ්ඩලයේ පර්ශ්‍රය තුළ පැවතුණි.

(v) ලක්කම් අලෙවි මධ්‍යස්ථානය සඳහා 2008 වර්ෂයේදී රු.306,750 ක් වැයකර මිලදි ගෙන තිබූ බිල්පත් මුද්‍රණ යන්ත්‍රය හා මෘදුකාංග සමාලෝචිත වර්ෂයේදී ද නිෂ්ක්‍රීයව පැවතුණි.

(vi) පාවිච්චියට ගත නොහැකි බැව් දන්වමින් පාවහන් නිෂ්පාදනය කරනු ලබන මැෂින් 16 ක් බොහෝ කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන සම්භාණ්ඩ මධ්‍යස්ථානයේ නිෂ්ක්‍රියව පැවතුණි.

(vii) ප්‍රතිලාභීන්ට බෙදා දීම සඳහා මිලදී ගෙන තිබුණු ගම්මාන ව්‍යාපෘතියට අයත් රු.2,771,972 ක් වටිනා පාවහන් නිපදවන මැෂින් 28 ක් සම්භාණ්ඩ මධ්‍යස්ථානය තුළ නිෂ්ක්‍රීයව පැවතුණි.

(viii) ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පොදු සේවා මධ්‍යස්ථානවලට හා ප්‍රතිලාභීන් සඳහා මිලදීගත් රු.16,726,979 ක් වටිනා භාණ්ඩ ගබඩාවේ පැවතුණි. මෙම භාණ්ඩ මිලදී ගෙන වර්ෂ 1 ත් 5 ත් අතර කාල පරාසයක පවතින අතර ඒවායේ ප්‍රයෝජනවත් කාලය ඉකුත් වෙමින් පැවතුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විටින් විට සභාපතිවරයාගේ අවධානයට යොමු කර ඇත. පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) අයවැය

(ඇ) මුදල් හා බැංකු කටයුතු

(ඈ) ගිණුම්කරණය හා මුද්‍රණ අංශයේ පිරිවැයකරණය

(ඉ) ණයගැති හා ණයහිමි

(ඊ) වාහන උපයෝජනය

(උ) තොග

(ඌ) පරිගණක පද්ධතිය